# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 243 — 1976 දෙසැම්බර් 10 වැනි සිකුරාදා — 1976.12.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිටු | | පිටු |
|---|---|---|---|
| පනත් ... ... ... | — | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... | 1/43 |
| ශ්‍රී ලංකා ඇපැල් මහ අධිකරණයේ දැන්වීම් ... ... | — | බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — | නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | 1/43 | විවිධ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | | |


සැ. යු.—(i) ගම්පහ තරුණ බෞද්ධ සමිතිය පනත් කෙටුම් පත 1976 නොවැම්බර් මස 26 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී; (ii) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයින්ගේ සහ උපදේශකවරුන්ගේ නාමාවලියක් පළවේ.

## දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම්

### දැන්වීමයි

කිරින්ද සංචාරක මහේස්ත්‍රාත් අධිකරණය 1977 වර්ෂය තුළ පැවැත්වෙන දිනයන් මහජනයාගේ දැනගැනීම සඳහා මෙහි පහත සඳහන් කරමි.

| | |
|---|---|
| 1977.01.20 | 1977.07.21 |
| 1977.02.17 | 1977.08.18 |
| 1977.03.17 | 1977.09.22 |
| * 1977.04.21 | 1977.10.20 |
| 1977.05.19 | 1977.11.17 |
| 1977.06.16 | 1977.12.15 |

* උසාවි නිවාඩු දිනයකි.—මෙම දිනයෙහි කිරින්ද සංචාරක අධිකරණය නොපැවැත්වේ.

මහේස්ත්‍රාත්,

12— 01— 1976.12.10 දින අංක 43 දරණ ගැසට් පත්‍රය ම තර

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

### පිස්කල් විකිණීම

කහටරුප්පේ පල්ලේපහළගේ රතල කොටුවව ගෙදර ලක්. පී. කිරිහාමි ..................................................... පැමිණිලිකරුවා.

එදිරිව

කහටරුප්පේ සළගිරිනිවසේ ඩී. ඇම්. පංචිබණ්ඩා ............ විත්තිකරුවා.

නොම්මරය : එම්/8665.

මෙහි පහත සඳහන්වෙන පද්පලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයන් වසී 1977ක් වූ ජනවාරි මස 07 දින පෙරවරු 10 ට ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. එනම් රුපියල් 850ක් සහ 1972 සැප්තැම්බර් මස 11 වැනි දින සිට මුදල ගෙවන තුරු නීති පොලිය සහ ගාස්තුව රු. 18[illegible]

### උපලේඛනය

1. ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර කෝට්ඨාශයේ කහටරුප්පේ [illegible] කුඹුර නමැති වී පැලක පමණ වපසරිය ඇති කුඹුරට මායිම් උතුරට: බී. ඇම්. තිසාහාමිගේ කුඹුරේ ඉම නියර; දකුණට: එපිට වත්ත; නැගෙනහිරට: කඳුර සහ බස්නාහිරට: උගනේ කුඹුරේ ඉම නියර මෙකී මායිම් තුල කුඹුර.

2. එසේම එම කහටරුප්පේ ඌරුමීතැන්නේගම පිහිටි අඹගහ කුඹුර නැමති වී පැලක පමණ වපසරිය ඇති කුඹුරට මායිම් උතුරට: සුදුබණ්ඩගේ කුඹුරේ ඉම නියර දකුණට: ඉම නියර නැගෙනහිරට: කඳුර සහ බස්නාහිරට: ඉම නියර මෙකී මායිම් තුල කුඹුරද වේ.

ඉහත සඳහන් පළමුවන ඉඩම ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. ආර්. විජේසිංහ මහතා විසින් සහතික කරන ලද අංක 15,559 දරණ උකස්කරයට යටත්ව විකුණනු ලැබේ.

ඒ. එස්. බී. වලිසුන්දර,
රෙජිස්ට්‍රාර්-පිස්කල්.

1976 නොවැම්බර් මස 24 වෙනි දින,
බදුල්ලේ දිසා අධිකරණයේ දීය.

[illegible]-32[illegible]—76.1[illegible]0 දින අංක 43 දරන ගැසට් පත්‍ර :

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළු දෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1976 පෙබරවාරි 27 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

1/43—7.222—5,675 (76/12)

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

1976 දෙසැම්බර් 10 වන දින

II වන කොටස

අතිරේකය

(76. 12. 20 දින නිකුත් කරන ලදී.)

# ගාල්ලේ සම්බෝධි ශුභසාධක සංගමය
## (සංස්ථාගත කිරීමේ)

ගාල්ලේ සම්බෝධි ශුභසාධක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

ආණ්ඩුවේ නියමය පරිදි පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ගැනීමට හැක.

## ගාල්ලේ සම්බෝධි ශුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ)

**ගාල්ලේ සම්බෝධි ශුභසාධක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

*පූර්විකාව.*

"ගාල්ලේ සම්බෝධි ශුභසාධක සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වන රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්යය සඳහා ගාල්ලේ මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එම සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහාජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක      දරන ගාල්ලේ සම්බෝධි ශුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ගාල්ලේ සම්බෝධි ශුභසාධක සංගමය සංස්ථාගත කිරීම.*

**2.** මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසු, මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන ගාල්ලේ සම්බෝධි ශුභසාධක සංගමයේ දැනට සාමාජිකයන් වූ සියළු තැනැත්තෝ හෝ මෙයින් සංස්ථාපනය කෙරෙන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයෝ "ගාල්ලේ සම්බෝධි ශුභසාධක සංගමය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාපිත මණ්ඩලයක් වන්නාහ. එය විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ හැකි හා කළ යුතු වන්නේ ය. තවද එකී නාමයෙන් පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ හා සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය.

*සංස්ථාවේ පොදු පරමාර්ථ.*

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) අංගවිකල සහ මන්දබුද්ධික ළමයින්ට ප්‍රතිකාර ලබාදීම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා නිවාස පවත්වා ගෙන යාම ;

(ආ) වයෝවෘද්ධ වී අසරණ තත්ත්වයට පැමිණ සිටින වැඩිහිටි අය සඳහා නිවාස පවත්වාගෙන යාම ;

(ඇ) අනාථ, අත්හල සහ අසරණ ළමයින් පුනරුත්ථාපනය කිරීම සඳහා නිවාස පවත්වාගෙන යාම ;

(ඇ) පිං බෙහෙත් ශාලා පවත්වාගෙන යාම ;

(ඉ) සංස්ථාවේ අංගවිකල හා මන්දබුද්ධික නිවාසවල වෙසෙන ළමයින්ට සුදුසු අධ්‍යාපනයක් ලබාදීම සඳහා පාසල් පිහිටුවීම සහ පාලනය කිරීම.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.**

4. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් සහ පරිත්‍යාගයන් ලබා ගැනීමේ ද සිය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවක මණ්ඩලය සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ එම පරමාර්ථ අතුරින් යම් කිසිවක් හෝ වැඩි දියුණු කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය කවර ආකාරයේ හෝ සියලු ක්‍රියා කිරීමේ ද සියලු කරුණු ඉටු කිරීමේ සහ සියලු දේ ක්‍රියාත්මක කිරීමේ ද බලය සංස්ථාවට තිබිය යුතු ය.

**විධායක කාරක සභාව.**

5. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ අනුශාසකවරුන්ගෙන්, සභාපතිවරයාගෙන්, උපසභාපතිවරු තිදෙනාගෙන්, ප්‍රධාන ලේකම්වරයාගෙන්, භාණ්ඩාගාරිකවරයාගෙන් සහ සහකාර ලේකම්වරයාගෙන් සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන තැනැත්තන් සංඛ්‍යාවකගෙන් ද සමන්විත වන විධායක කාරක සභාවක් මගින්, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව, මේ පනත ආරම්භ වන දින ධූර දරන, සංගමයේ කාරක සභාවේ අනුශාසකවරුන්ගෙන්, සභාපතිවරයාගෙන්, උපසභාපතිවරුන්ගෙන්, ප්‍රධාන ලේකම්වරයාගෙන්, භාණ්ඩාගාරිකවරයාගෙන්, සහකාර ලේකම්වරයාගෙන් සහ සෙසු සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

**භාරකාර මණ්ඩලය.**

6. (1) සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීති අනුව, අවස්ථාවෝචිත පරිදි, තෝරා පත් කර ගත යුතු හෝ පත් කර ගත යුතු, තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත භාරකාර මණ්ඩලයක් තිබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දින ධූර දරන සංගමයේ භාරකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය විය යුතු ය.

**පාලක මණ්ඩලය.**

7. (1) පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වන පාලක මණ්ඩලයක් විය යුතු ය:—

(අ) සංස්ථාවේ සභාපතිවරයා ;

(ආ) සංස්ථාවේ භාරකාර මණ්ඩලය විසින් පත් කරන ලද එම මණ්ඩලයෙහි සාමාජිකයින් දෙදෙනෙක් ;

(ඇ) සංස්ථාවේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා පත් කරනු ලබන සංස්ථාවේ සාමාජිකයින් දෙදෙනෙක්.

(2) භාරකාර මණ්ඩලයෙහි ලේකම් පාලක මණ්ඩලයේ ලේකම් ද විය යුතු ය.

(3) රුපියල් එක් දහස ඉක්මවා යන වැය කිරීමක්, බද්දක්, කුලියට ගැනීමක්, බදු මුදලක්, උකසක්, විකිණීමක්, මිලට ගැනීමක් හෝ ත්‍යාගයක් වශයෙන් වූ හෝ අන් ආකාරයක වූ හෝ යම්කිසි දේපළ බැහැර කිරීමක්, ඒ වැය කිරීම හෝ බැහැර කිරීම සඳහා පාලක මණ්ඩලයේ පූර්ව අනුමතිය ලැබී ඇතොත් මිස, වලංගු නොවන්නේ ය.

(4) විධායක කාරක සභාව විසින් පාලක මණ්ඩලයේ අනුමතිය පූර්වයෙන් ලබා ගෙන තිබේ නම් මිස, විධායක කාරක සභාවට සංස්ථාව වෙනුවෙන් ණයට ගැනීමේ බලය ක්‍රියාත්මක කරනු ලැබිය නොහැකි ය.

(5) මේ පනත ආරම්භ වන දින ධුර දරන සංගමයේ පාලක මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

8. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම සඳහා ද විධායක කාරක සභාවේ, භාරකාර මණ්ඩලයේ සහ පාලක මණ්ඩලයේ සහ සංස්ථාවේ නොයෙකුත් නිලධරයන්ගේ සහ නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ වැඩ කටයුතු පාලනය කිරීම සඳහා ද සභා රැස්වීම් කටයුතු පිළිබඳ කාර්ය පටිපාටිය සඳහා ද පොදු වශයෙන් සංස්ථාවේ කටයුතු පාලනය කිරීම සඳහා ද සංස්ථාවේ පරමාර්ථයන් මුදුන්පත් කර ගැනීම් සඳහා ද තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී වැඩි ඡන්දයෙන් රීති සාදනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය. එකී රීති සෑදීමෙන් පසු, (2) වන උප වගන්තියේ නියමයන්ට යටත්ව, එවැනිම රැස්වීමක දී, එකී රීති වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම ද කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කරනු ලබන කිසිම රීතියක් හෝ වෙනස් කිරීම, සංශෝධනය කිරීම, අවලංගු කිරීම හෝ ඊට යමක් එකතු කිරීම, සංස්ථාවේ මහා සභා රැස්වීමකට සහභාගි වී ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් හැර, කරනු නොලැබිය යුතු ය.

(3) මේ පනත ආරම්භ වන දින බලපවත්නා සංගමයේ රීති සංස්ථාවේ මේ වගන්තිය යටතේ සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් වන්නාහ.

සංගමයෙන් ගෙවිය යුතු හා සංගමයට අයවිය යුතු ණය.

9. මේ පනත ක්‍රියාත්මක වන වේලාවේ දී පවත්නා සංගමයේ සියළුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර සංගමයට අය විය යුතු සියළුම ණය, ග්‍රාහක මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථා විසින් නිශ්චල හා චංචල දේපළ තබා ගත හැකි බව.

10. යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමැති පත්‍රයකින් බුදල් බෑහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතුවන යම් චංචල හා නිශ්චල දේපළක් භාර ගැනීමටත් තබා ගැනීමටත් නීතියෙහි ලා සංස්ථාවට හැකියාව හා ශක්නුතාව ඇත්තේ ය. තවද එකී සියළු දේපළ ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හා අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්යයන් සඳහා, සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව විසින් තබා ගත යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**11.** සභාපතිවරයා සහ ප්‍රධාන ලේකම්වරයා හෝ භාණ්ඩාගාරිකවරයා යන විධායක කාරක සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර එකී සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී ලේඛනයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනයම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නො වන්නේ ය.

# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**1976 දෙසැම්බර් 10 වන දින**

**II වන කොටස**

## අතිරේකය

**(76. 12. 22 දින නිකුත් කරන ලදී.)**


# මුදල් (සංශෝධන)

**1971 අංක 38 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

**මුදල් අමාත්‍යවරයාගේ නියමය පරිදි පළකරන ලදී.**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

1A——ඊ 23839—1,000 (76/11)

## නීතිය බලපෑමේ ප්‍රකාශය

2 වන වගන්තිය මගින් 10අ වන අලුත් වගන්තියක් 1971 අංක 38 දරන මුදල් පනතෙහි ඇතුළත් කරනු ලබන අතර මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව උචිත අමාත්‍යවරයා විසින් බලය දෙනු ලැබුවහොත් මිස ඇතැම් පාඩු පොතින් ලියා අස් කිරීම රාජ්‍ය සංස්ථාවලට තහනම් කිරීම ඒ වගන්තියෙහි නීතිය බලපෑම වන්නේ ය.

1– ඒ 23860–6,970 (76/11)

# මුදල් (සංශෝධන)

එල්.ඩී.—ඕ. 26/76.

**1971 අංක 38 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1976 අංක     දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. 1971 අංක 38 දරන මුදල් පනතේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම පනතේ 10අ වන වගන්තිය ලෙස බල පවත් වන්නේ ය :— *10අ වන **අලුත්** වගන්තිය 1971 අංක 38 දරන මුදල් පනතෙහි ඇතුළත් කිරීම.*

*ඇතැම් පාඩු පොතින් ලියා අස් කිරීමට අදාළ විධිවිධාන.*

10අ. (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, කිසිම සංස්ථාවක් විසින්, ඒ සංස්ථාව විසින් දරන ලද යම් පාඩුවක් මේ වගන්තියේ විධිවිධාන වලට අනුකූලව මිස පොතින් ලියා අස් නොකළ යුතු ය.

(2) යම් රාජ්‍ය සංස්ථාවක් විසින් දරන ලද යම් පාඩුවක් පොතින් ලියා අස්කළ යුතු බව ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ මතය වන අවස්ථාවක එම පාඩුවට අදාළ සියලු කරුණු ඇතුළත් වාර්තාවක් ඒ සංස්ථාව විසින් උචිත අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි සඳහන් පාඩුව පොතින් ලියා අස්කළ යුතු බවට උචිත අමාත්‍යවරයා සෑහීමට පත් වන්නේ නම් ඔහු විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, එම පාඩුව පොතින් ලියා අස් කිරීමට එම සංස්ථාවට අවසර දිය හැකි ය.

(4) මේ වගන්තියෙහි "පාඩුව" යන යෙදුමෙන්—

(අ) රාජ්‍ය සංස්ථාවකට අයිති (මුදල්, මුද්දර, බඩු බාහිරාදිය, පශු සම්පත්, බෝග, පිරියත සහ ටිකට් පත් ද ඇතුළුව) යම් දේපළක් නැතිවීම හෝ එයට අලාභ හානි සිදුවීම ;

(ආ) රාජ්‍ය සංස්ථාවකට බදු දී ඇති හෝ අන්‍යාකාරයකින් එය සන්තකයෙහි ඇති යම් දේපළක් නැතිවීම හෝ එයට අලාභ හානි සිදු වීම ;

(ඇ) යම් වැඩිපුර ගෙවීමක් හෝ වැරදි පාර්ශ්වකරුවන් වෙත කරන ලද ගෙවීමක් ;

2—ඒ 23860 (76/11)

1A——ඒ 23879—1,000 (76/11)

(ඇ) අවසර නොලද ගෙවීමක් හෝ වැරදීමෙන් කරන ලද ගෙවීමක් ;

(ඉ) රාජ්‍ය සංස්ථාවක සේවකයකුගේ අතපසු කිරීමකින්, නොසැලකිල්ලකින්, ප්‍රමාදයකින් හෝ නොකර හැරීමකින් සිදුවූ යම් පාඩුවක් වෙනුවෙන් අලාභ ගෙවීම සඳහා දරන ලද යම් වියදමක් ; නැතහොත්

(ඊ) අයකර ගත නොහැකි පොත් ණයක් අදහස් වේ.